ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 මැයි 31 වැනි දින |

**2013 මැයි මාසයේ දී උද්ධමනය ඉහළ යයි.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 6.4 හි සිට 2013 මැයි මාසයේ දී සියයට 7.3 දක්වා ඉහළ නැගිණි. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය මීට පෙර මාස දෙකෙහිම වාර්තා කළ පරිදි 2013 මැයි මාසයේ දී සියයට 8.8 හි නොවෙනස්ව පැවතිණි.

ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය පූර්ව මාසයේ පැවති සියයට 6.1 හි සිට 2013 මැයි මාසයේ දී සියයට 5.7 දක්වා පහළ වැටුණු අතර, එය වාර්ෂික සාමාන්‍ය පදනම මත 2013 අප්‍රේල් මාසයේ පැවති සියයට 6.5 හි සිට 2013 මැයි මාසයේ දී සියයට 6.6 දක්වා සුළු වශයෙන් ඉහළ නැගිණි.




කො.පා.මි. දර්ශක අගය 2013 අප්‍රේල් මාසයේ පැවති 170.0 හි සිට 2013 මැයි මාසයේ දී 173.9 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 2.3 කින් ඉහළ නැගිණි. ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් සියයට 3.7 කින් ඉහළ යාම දර්ශකයේ මෙම මාසික වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර නොවන කාණ්ඩයේ, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 9.9 කින්); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 2.7 කින්); විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.4 කින්); අධ්‍යාපන (සියයට 0.2 කින්); රෙදිපිළි හා පාවහන් (සියයට 0.1 කින්); සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ නැගිණි. 2013 අප්‍රේල් මස 20 වැනි දින සිට විදුලිය ගාස්තු ඉහළ නැංවීමෙන් ඇති වූ බලපෑම නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයෙහි ඉහළ නැගීම සඳහා මුළුමනින්ම හේතු විය. මේ අතර, සෞඛ්‍ය; සන්නිවේදන; සහ ප්‍රවාහන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි. තවද, ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ගණන් ද මැයි මාසයේ දී සියයට 0.6 කින් ඉහළ ගියේය. බොහෝ එළවළු වර්ග, නැවුම් මාළු වර්ග; කුකුළු මස්, රතු ළූණු, දෙහි සහ කිරිපිටි ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. කෙසේ වුවද, සමහර පළතුරු වර්ග, බිත්තර, ලොකු ළූණු සහ සීනිවල මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය.